**ෆියැන් ශ්‍රී ලංකා ආයතනයේ ජාතික පෝෂණ ප්‍රතිපත්තිය සඳහා ලබා දෙනු ලබන යෝජනා විවේචන**

පෝෂණ ප්‍රතිපත්තියේ හැදින්වීමේ සඳහන් කර ඇති පරිදි 1986 සිට ක්‍රියාත්මක ඉදිරි පියවරක් ලෙස මෙම ප්‍රතිපත්තිය ඉදිරි පත් කරන බවත් සඳහන් කර ඇත. එහෙත් මෙම පෝෂණ ප්‍රතිපත්තිය සමඟ සමපාත වන අනෙකුත් ලියවිලි හෝ අන්තර්ජාතික හා කලාපිය වශයෙන් ඇති කරගත් එකඟතා හා ප්‍රඥප්තින් පිලිබඳව සඳහන් කර නැත. එලෙසම මෙම ප්‍රතිපත්තිය සමඟ ඍජුවම සම්බන්ධ හා වගකීම් දරණ ආයතනික ව්‍යුහය පිලිබඳව සඳහනක්ද නැත.

විශ්ෂයෙන් මෙවැනි ප්‍රතිපත්තියකදී කියවෙන අනෙකුත් ප්‍රතිපත්ති ගැන සඳහනක් තිබිම වැදගත් වේ. විශේෂයෙන් කෘෂිකම් ප්‍රතිපත්තිය ධීවර ප්‍රතිපත්තිය, රටේ ආර්ථික ප්‍රතිපත්තිය සහ රජයේ අනෙකුත් ප්‍රතිපත්ති පිලිබඳව සඳහනක් තිබිම වැදගත්වේ. එහෙත් ඒ පිලිබඳව හැදැන්වීම තුල සඳහනක් නොවිම පිලිගත් ප්‍රතිපත්ති සම්පාදනයේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය නොසලකා හැරිමක් ලෙස සඳහන් කරමු.

__2 පිටුව__

පොදු ජනතාවට පෝෂදායි ආහාර වේලක් දැරිය හැකි මිලකට ලබාදිම සහතික කල යුතුවේ යන්න හොඳ සඳහනක් වුවද එය ලඟාකර ගත යුත්තේ කෙසේද යන්න පැහැදිලි නැත. එවැන්නක් සඳහන් කිරිම පමණක් ප්‍රමාණවත් නැත.

__2 පිටුව 2.3__ තුල සඳහන් කර ඇති ආකාරයට සෞඛ්‍යයට අහිතකර ලෙස බලපාන බව සඳහන් කර ඇති අතර එය නීතියානුකුලව සිදුවන කටයුත්තක්ද නීතියානුකුල නොවන ආකාරයට සිදු කරනු ලබන ආයතනයක්ද යන්න සඳහන් කිරිම වටි. එසේනම් නීතිය ක්‍රියාත්මක නොවීම පිලිබඳව ක්‍රියාකාරකම් එක්කල යුතුය.

__2.3__ සඳහන් කර ඇති ආකාරයට සෞඛ්‍ය සම්පන්න ආහාර අලෙවිසැල් හිග වීම ගැන සඳහන් යම් ආකාරයක සාධාරන වුවත් යම් ප්‍රාමාණයකට හෝ ගෙන ඇති පියවර අතර සාධනීය ලෙස කෘෂිකම් හා පලාත් කෘෂිකම් දේපාර්තමෙන්තු යටතේ ඇති කර ඇති ''හෙළ බොජුන්'' සහ උතුරු නැගෙනහිර ''අමාච්චි'' යම් ප්‍රමාණයකට වැදගත් පියවරක් ලෙස සඳහන් කල යුතු බව යෝජනා කරමු.

__2.4__ ආහාර සුරක්ෂිතතාවය යනුවෙන් ලබාදී ඇති අර්ථ කථනය වැරදිය මෙය සිංහල ලියවිල්ලේ සඳහන් ආකාරය පරිවර්ථනයේ දෝශයකි. මෙය සම්පුර්ණ වශයෙන් වැරදි අර්තකථනයක් වී ඇත. Food safety සහ Food Security යනු එකිනෙකට වෙනස් කාරණා දෙකකි. එහි ඇති කරුණු සාවධ්‍ය වන අතර ආහාර වල ආරක්ෂිතභාවය වෙනුවෙන් ක්‍රියාකිරිමේ,

i ප්‍රතිපත්ති හා එහි නීතිමය රාමුව

ii පාලනය සහ කළමණාකරනය

iii අවධානම් පිලිබඳ පරික්‍ෂාව

iv දත්ත සහ තොරතුරු මැයින් අවදානම් ආහාර පිලිබඳ පාලනයට අවශ්‍ය විධිමත් භාවය ලබා ගැනිම.

v ජාතික වශයෙන් පරික්‍ෂණාගාර ජාලයක්

vi පෙර සුදානම් හා ප්‍රතිචාර මඟින් ආහාර ආරක්ෂාව පිලිබඳ හදිසි තත්වයකදී ක්‍රියාකිරිම

vii ආහාර වල ආරෂිතභාවය  පිලිබඳ සංනිවේදනය සහ අධ්‍යාපනය

ලෙස දිශානුගත විය යුතුය ආහාර නිශ්පාදනය කිරිම, ගබඩා කිරිම, ප්‍රවාහනය සහ සැකසීම ඇතුළු සැපයුම් දාමයේ ක්‍රියාවලියෙන් ඔබ්බට ගිය ආහාර පිලිබද ආරක්ෂාවක් අවශ්‍ය වේ.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වසවිස භාවිතය පිළිබඳව ලබා දෙන තොරතුරු දත්ත වලදී මෙම කරුණු සනාත වීම වැදගත් වන අතර එය ශ්‍රී ලංකාව තුල වස විස නැති ආහාර වල මීල ඉහල යාමට සේම වගා සහතිකකරණය වැනි විශයන් පිලිබඳ හේතු වේ. දැනට ආහාර හා විශේෂයෙන් ජලයේ කෘෂි රසායන සොයා ගැනිම පිලිබඳව විධිමත් හැදැරීම් හා ක්‍රියාවලියක්ද මෙම ප්‍රතිපත්තියෙන් ඔබ්බට සිදු කල යුතුය. අපට ප්‍රධාන බාදාවක් වී ඇති පරීක්ෂණයන් වල පහසුකම් අඩු වීම සහ ඒවායේ මිල ඉහල අගයක් ගැනිම පිලිබඳව අවධානය යොමු විය යුතුය.

<u>2.6</u> අතිගරු ජනාධිපති තුමගේ මුලිකතාවයෙන් ඇති රජ්‍ය ජාතික පෝෂණ කවුන්සලය තබාගෙන ජාතික පෝෂණ ලේකම් කාර්යාලය ඉවත් කිරිම, මෙම යාන්ත්‍රණයේ  සම්බන්ධීකරණය හා අධීක්ෂණයට ඇති ප්‍රධාන බාධාව වී ඇත. එසේම රාජ්‍ය නොවන සංවිධානවල සේවාව ලබා ගැනිම සඳහා මෙම අංශයේදී ඉතා සුවිශේෂිකාර්යභාරයක් කරනු ලබන සංවිධාන මෙන්ම ගෙවතු වගාවන් ජනප්‍රිය කරන ප්‍රජා මුලික ආයතනයේ සිට වැදගත් වේ. ඒ ගැන සඳහන් කිරිමේදී රජයේ අනෙක් ක්‍රියාකරකම් වලදී රාජ්‍ය නොවන සංවිධාන හතුරන් ලෙස සලකා වැඩ  කිරිම වෙනුවට මෙලෙස පාර්ශව කරුවන් ලෙස සලකා පහසුකම් සැපයිම වැදගත් වන ඇත. ජනසවිය භාරකාර  අරමුදලේ  තිබු ආකාරයට පෝෂණය පිලිබඳ විවිධ ප්‍රජා ව්‍යාපෘති සඳහා සම්බන්ධ කොට ගත් වැඩ පිලිවෙලක් සිදු කරලිම මගින් වඩා හොද ක්‍රියාකාරිත්වය අපේක්ෂා කල හැක.

**<u>3 ජාතික පෝෂණ ප්‍රතිපත්තිය</u>**

2010 සංශෝධනය කිරිමේ අවශ්‍යතාවය පිලිබඳ අවධාරණය කරනු ලබන කාරණා සලකා බැලිමේදී නව රජයක් හා නව ජනාධිපති වරයෙක් පත්වීම මඟින් රජයේ දේශපාලන යාන්ත්‍රණය පුර්න වශයෙන් වෙනසකට භාජනය වී ඇති නිසාත් විවිධ ප්‍රතිපත්ති (2010) වසර 10 කින් කල් ඉකුත්වී ඇති නිසාත් නව ප්‍රතිපත්තියක අවශ්‍යතාවය රජයේ අනෙකුත් වැඩසටහන් සමඟ සමපාත වන ලෙස සිදුකල යුතුය. දැනට මෙම ප්‍රතිපත්තියේ සඳහන් කර ඇති හේතුව පෝෂණයට වියදම් කරන සෑම ඩොලර් 1කටම ඩොලර් 16ක ප්‍රතිලාභය පිලිබඳ පැහැදිලි කිරිමක් සිදුකල යුතුය. එය පාද සටහනක් ලෙස සඳහන් කිරිම වැදගත්ය.

**<u>4 ප්‍රතිපත්ති ක්‍රියාවලිය</u>**

සියලුම අදාල අංශ වලින් විදිමත් මඩුල්ලක් මගින් ජාතික පෝෂණ ගැටළු සඳහා ගෙන මෙම ප්‍රතිපත්තිය ගොඩ නගා ඇත. ඒ සඳහා සිවිල් සංවිධාන මගින් අදහස් ලබා ගැනිම සාධනීය ක්‍රියා මාර්ගයක් වන අතර තව දුරටත් පලාත් මට්ටමින් ආහාර හා පෝෂණ විෂය සමගාමී ලෙස පත්ව ඇති තත්වයන් තුල පලාත් සභා හා අනෙකුත් පාර්ශවයන්ගේ අදහස් ලබා ගන්නේ නම් වැදගත් බව දනුවමු.

**<u>9 ක්‍රියාව සඳහා ප්‍රතිපත්ති ප්‍රමුකතා ක්ෂේත්‍ර</u>**

ආරක්ෂිත ආහාර සඳහා අයිතිය තහවුරු කිරිම හා සමහර නීති විරෝධි අලෙවි කරණය වැලැක්වීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරිම යනුවෙන් සඳහන් කර ඇති කාරණය තුලින් දක්වන කාරණය ප්‍රමුඛතා කිරීම සඳහා වැදගත් වන අතර මුලික වශයෙන් පොදුවේ ආහාර වලට ඇති අයිතිය ප්‍රමුඛතා ගත කල යුතුය. එය පෝෂ්‍යදායි ආහාරයක් මගින් ආරක්ෂිත ආහාරයක්ද විය යුතුය. විශේෂයෙන්

නේපාලය, ඉන්දියාව ඇතුළු කලාපයේ රටවල් මෙන්ම අපේ රටේද ආහාර අයිතිය ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ලෙස සඳහන් කල යුතුය.

**10 ප්‍රතිපත්ති ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා මූලික උපාය මාර්ගික නිර්දේශ**

10.1 පුරවැසියන්ගේ ආහාර අයිතිය පිලිබඳ ව්‍යාවස්ථාමය වශයෙන් ආයතනීය තහවුරු වීමක් සිදුකිරිම සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශයක් බැහැරට ගොස් සිදු කලයුතු කාර්යයක් සේ සැලකිය යුතුය. රජයේ වගකිම ලෙස අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii පරිච්චේදයේ සඳහන් කර නොමැති වීම නිසා දුප්පත් ජනතාව ඒවා පිලිබඳ රජයෙන් සේවා ලබා ගැනීමට ඇති බාදා ඉවත් කල යුතුය.

එලෙසම අවසානයට සඳහන් කර ඇති වතුකරයේ ජනතාව හා නාගරික අඩු ආදායම් ලාභින් ආදී පිරිස් වලට අනිවාර්යෙන් එකතු විය පිරිසක් වන " විවිධ ආපදා වලට හදිසි විපත් වලට, සහ ව්‍යසනයන්ට ගොදුරු වුවන්" ඇතුලත් විය යුතුය.

10.2.4 පලාත්, දිස්ත්‍රික් හා ප්‍රදේශිය මට්ටමින් යන්නට 'පලාත් පාලන' ආයතනද ඇතුලත් කල යුතුය. විශේෂයෙන් ප්‍රදේශියසභා, නගර සභා, මහානගරසභා ආහාර පෝෂණ විෂයේදී ඉතා හොදින් කාර්යභාරයක් සිදුකර ලබන නිසා ඒවා ඇතුලත් කිරිම අත්‍යාවශ්‍යය.

10.3 ආරක්ෂිත ආහාර සඳහා අයිතිය පිලිබඳව පූර්ණ කරුණු සැලකිල්ලට ගත්විට ආහාර අයිතිය සබැඳුනු අන්තර්ජාතික නිර්දේශ සහිත මාර්ගෝපදේශණය සැලකිල්ලට ගත යුතුය. ජානමය වෙනස් කරන ලද ආහාර පිලිබඳ ආදහස් වැදගත් වන අතර ඒවා ආහාර වල විශ්වාසය පලුදු වීමට හේතු වී ඇතිවාක් පමණක් නොව ඒ පිලිබඳව පවතින ලේබල් කිරිම පවා හරි ආකාරයට සිදුවන් නේද යන්න සොයා බැලිම නිසි ලෙස සිදු නොවේ.

විශේෂයෙන් මෙරටට බහුලව ආනයනය කරනු ලබන බඩ ඉරිගු, තක්කාලි, සොයා මගින් G.M.O පැමිණෙන අතර දැනට කුඩා ළමුන්ට හා ගර්භනීය මවුවරුන්ට ලබාදෙන ත්‍රිපෝෂ සෑදිම සඳහා ගනු ලබන අමුද්‍රව්‍ය අතර බඩ ඉරිගු සහ සොයා වැනි අමුද්‍රව්‍ය ජානමය වෙනසකට භාජනය කරන ලද භෝගවලින් ලබා ගන්න බවට තොරතුරු ලැබී තිබේ.

10.3.2 ශක්තිමත් ආහාර සදාචාර විරෝධි අලෙවි කරණය පාලනය කිරිම සඳහා මාධ්‍ය ආචාරධම් පද්ධතියක් හදුන්වා දිය යුතුය. වෙලෙඳ පොල ඉලක්ක කරගෙන කරනු ලබන ප්‍රචාර සඳහා මාධ්‍යයට බලපෑමක් ලෙස එම එම ආචාරධම් පද්ධතිය පාවිච්චි කල හැක. නීතිමය කරුණු වලින් පාලනය යම් තාක් දුරට පමණක් කල හැකිවනු ඇත.

10.4.2 මෙම කාරණයට අමතරව නිසි පෝෂණයක් ලබාදීම සඳහා දැනට ගර්භනි මව්වරුන්ට ලබා දෙන පෝෂණ මල්ල විද්‍යාත්මකව කෙතරම් පෝෂණීයද යන්න සොයාබැලිය යුතුය. ඒ මගින් නිසි යාන්ත්‍රනයක් යටතේ ගර්භනී කාලය තුල නිසි පෝෂණය වෙනුවෙන් ආහාරමය නිර්දේශ ඇතුලත් සහනාධාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරිමට යෝජනා කල හැක.

10.4.5 පාසැල් වල ඇති ආපන ශාලා වලින් මුදල් අයකිරිම පාසැල් වල ආදායම් මාර්ග බවට පත්කරගෙන ඇති අතර පාසැල් ක්‍රිඩා තරග වලට හා විවිධ උත්සව සඳහා විවිධ ආහාර හා පාන නිපදවන සමාගම් අනුග්‍රාහකත්වය ලබාදිම මගින් එම පාසැල්වල ආපනශාලාවල විකිණිය යුත්තේ ඉහත අනුග්‍රාහකයන් ලබාදෙන බීම වර්ගය පමණක් බවට වන නිර්දේශය හා වෙනත් බලපෑම් නතර

කිරීමට හේතුවන නීති සැදිය යුතුය. ඒවා පාසැල් පරිපාලනයට හා ගුරු දෙගුරු සංගම් වලටද බලපාන ලෙස පැනවිය යුතුය.

10.5 ආහාර වල වටිනාකම් දාමයන් සඳහා ප්‍රචලිත ක්‍රමවේදය වුනුයේ ඒවා සපයා ගැනිමට ඇති හැකියාව අනුවයි. එහෙත් සාම්ප්‍රදායික ඇතැම් ආහාර වර්ෂික පෝෂණයෙන් අනුන වුවද නිශිචිත ලෙස වෙලඳ පොලක් නොවීම නිසා ඒවා වගාව අතහැර දමා ඇත. එවැනි ආහාර භෝග පිලිබඳ අධ්‍යානයක් කර ඒවායේ පෝෂණය හා වෙනත් ගුණයන් පිළිබඳ ප්‍රචලිත කිරිම කල යුතුය.

10.6.1 පෝෂණ මට්ටම වැඩි දියුණු කිරිමේ සාක්ෂි මත පදනම් වු ඉලක්ක ගත පෝෂණ ක්‍රියාමාර්ග තුලට එක් කර ගත යුතු වර්තමාන යුගයට ගැලපෙන අනෙකුත් බොහෝ රටවල් අනුගමනය කරන ලද (E-Nutrition) ඉ- නියුට්‍රිෂන් ක්‍රමවේදයට ගැලපෙන ක්‍රියාමාර්ගයකට ගමන් කල යුතු වේ. ඒ සඳහා අප ක්‍රමවේදයක් ලෙස පර්යේෂන තොරතුරු පමණක් නොව සියලු තොරතුරු හා පෝෂණය පිලිබඳ සියලු ආහාර ඒ සඳහා ඇතුලත් කර ගනිමින් තාක්ෂනික ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කල යුතුය.

10.6.2 උපාය මාර්ගික තොරතුරු ලෙස වෙනම පවත්වාගෙන යාමේ වැදගත් කමක් පවතින අතර ඒ සඳහා අවශ්‍ය ආහාර චර්යා රටා පිලිබඳ අධ්‍යනය හා නවීන කාලයට ගැලපෙන පෞරාණික ආහාර රටා හා විවිධ රස කේන්ද්‍ර කරගත් ආහාර වට්ටෝරුවක් අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කල යුතුය. විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය වෙනුවෙන් වන ආහාර රටා මෙන්ම අනෙකුත් සම්බන්ධිත ක්ෂේත්‍ර සඳහා ඇගයිම මෙන්ම අධ්‍යනයක්ද කල යුතුය.

## 11 ප්‍රතිපත්තියේ අපේක්ෂිත බලපැම්

1

2

3 ජනතාවගේ ආහාර අයිතිය තහවුරු කරමින් ප්‍රමාණවත් පෝෂදායි ආහාර ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරිම.

12 ජනාධිපති ලේකම් කාර්යාලාය යටතේ වු පොෂණ ලේකම් කාර්යාලය පිලිබඳ විස්තර හා ආයතනයක යොමුව විස්තර කර ඇති අතර ඒවායේ නිශ්චිත ක්‍රියාමාර්ග ද සඳහා කර ඇත. එහෙත් රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති ලියැවිල්ල වන ''සෞභාග්‍යයේ දැක්ම'' දක්වන පරිදි සුව දිවිමග නැමැති වැඩ සටහනක් යෝජනාකර ඇත. එහි සඳහන් ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්ති ලියවිල්ලේ නොමැතිනිසා ක්‍රියාත්මක විමේදී ගැටළු පැනනැගිය හැක.

- පැමිනිලි කිරිමේ හා විසදුම් ලබාදීමේ ක්‍රියාවලියක් පිලිබඳ අදහස මෙම ප්‍රතිපත්තිය තුල අන්තර්ගතවී නොමැති අතර එය පෝෂණ ප්‍රතිපත්තියේ අභිමතාර්ථ සහ අරමුණු ලගා වීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් වනු ඇත.